# පතහවත්ත රජමහා විහාරයේ පුරාවිද්‍යා සාධක පිළිබඳ ජනප්‍රවාද ඇසුරින් කෙරෙන විමසුමක්

අයි.ඒ.යූ. පුෂ්පමාලි[1]

මෙම අධ්‍යයනය බස්නාහිර පළාතේ, රයිගම් කෝරලයේ, පතහවත්ත ග්‍රාමයේ පිහිටි රයිගම් බණ්ඩාර රජුගේ මාළිගය ලෙස ජනප්‍රවාදයෙහි එන පුරාවිද්‍යා සාධක රැසකින් හෙබි පතහවත්ත රජමහා විහාරය ආශ්‍රය කරගනිමින් සිදු කරනු ලැබේ. වීර අලකේශ්වර රජු ආරම්භක පාලකයා වූ මෙහි කීර්තිමත් පාලක රයිගම් බණ්ඩාර රජු සමය වන විට රාජ පරම්පරා දහයක් යටතේ නඩත්තුව ඇති බව සඳහන් වේ. මෙම ස්ථානය ආශ්‍රිතව පවතින පුරාවිද්‍යාත්මක සාධක හා ජනප්‍රවාද සාධක අතර අන්තර් සම්බන්ධතාවයක් පවතී ද යන්න පිළිබඳ විමර්ශනයක් කිරීම පර්යේෂණයේ අරමුණ වේ. මෙම අධ්‍යයනය සඳහා දත්ත රැස්කිරීමේ හා වාර්තා කිරීමේ ක්‍රමවේද ලෙස සාහිත්‍ය මූලාශ්‍රය පරිශීලනය, ක්ෂේත්‍ර ගවේෂණය හා සම්මුඛ සාකච්ඡා සිදු කරන ලදී. විහාරාධිපති පූජ්‍ය දියකඩුවේ සෝමානන්ද හිමි සහ ප්‍රදේශවාසීන් සමඟ සාකච්ඡා කර ජනප්‍රවාදගත කරුණු ගොනුකර ගන්නා ලදී. ඡායාරූප ලබාගැනීම සහ පරිමාණුකූල සැලසුම් ඇඳීම වාර්තා කිරීමේ ක්‍රමවේදය ලෙස භාවිත කෙරිණි. ජනප්‍රවාදගත කරුණු සංසන්දනාත්මකව ඉදිරිපත් කිරීම මෙහිදී අපේක්ෂිතය. පතහවත්ත පිළිබඳ ඇති ජනප්‍රවාද බොහෝමයක් මෙම ස්ථානය රාජධානියක්, එසේත් නොමැතිනම් මාළිගාවක් පැවති බවට වන කරුණ වටා ගොඩනැගී ඇත. දැනට අක්කර පහකට ආසන්න ප්‍රදේශයක් වටා එකසේ ආවරණය වී ඇති පළල අඩි හයකින් හා උස අඩි අටකින් යුතු කබොක් ගලින් කරන ලද ප්‍රාකාරයට ප්‍රධාන තැනක් හිමි වේ. මෙසේ කබොක්ගලින් පවුරු බැඳීමේ තාක්ෂණය කෝට්ටේ යුගයේ ඉස්මතු වූ අතර මෙම පවුර එම යුගයේ දී ඉදි වූ බවට උප කල්පනය කළ හැකිය. එසේම තනි කළුගලින් කරන ලද දෙපසට දෙපා යුගල දෙකක් ඇති වැසිකිළි පාදුකාව ද, කැටයම් රහිත සඳකඩ පහණ ද, විහාර භූමියේ විසිරී ඇති විශාල කළුගල් කුළුණු ද, මුඛයෙන් ජලය විදින ලෙස නිර්මාණිත ඇත්හිස හැඩැති අලංකරණය ද, නිර්මාණ හා තාක්ෂණික ලක්ෂණ අතින් සලකා බලන කල්හි ආගමික ස්ථානයකට වඩා ලෞකික ගොඩනැගිල්ලක් ආශ්‍රිතව පැවතුණ බවට නිගමනය කළ හැකි සාධක වේ. එසේම රාජකීය නාන තටාකය යැයි සැළකෙන වර්තමානයේ සංරක්ෂිත පුරාවිද්‍යා ස්මාරකය වන පතහ, දිගින් මීටර් 34 සහ පළල මීටර් 22.45 වන අතර ගැඹුර මීටර් 4කි. මෙය කි.මී 4ක දුරින් පිහිටි පොකුණුවිට විහාරයේ පොකුණට උමඟකින් සම්බන්ධ වී ඇති බව ජනප්‍රවාදයේ එයි. පතහෙහි ගිණිකොන දෙසට වන්නට දිය නොසිඳෙන ළිඳකි. මෙවැනි ජනප්‍රවාදගත කරුණු පුරාවිද්‍යාත්මක සාධක හා පූර්ව අධ්‍යයනවල තොරතුරු දෙස සංසන්දනාත්මකව අවධානය යොමු කිරීමේදී පතහවත්ත රජමහා විහාර භූමිය රයිගම් බණ්ඩාර රජුගේ රාජධනිය බවට වූ ප්‍රවාදගත අදහස පිළිගැනීමට ප්‍රමාණවත් සාධක ඇති බව පෙන්වාදිය හැකිය.

ප්‍රමුඛ පද : රයිගම් බණ්ඩාර, පතහවත්ත, ජනප්‍රවාද, පුරාවිද්‍යා සාධක

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය. ushani.pushpamali@gmail.com